**සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**(සිංහල භාෂා ඒකකය)**

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023**

**පාසල් මට්ටම**

1) අපේක්ෂකයාගේ නම :- ..............................................................................
   (මුලකුරු සමඟ නම පැහැදිලිව ලියන්න.)
2) විදුහලේ නම හා ලිපිනය :- ..............................................................................
   ..............................................................................
3) පාසල් වර්ගය :- 200 ට අඩු/ 201-500/ 501 ට වැඩි
4) කලාපය :- ..............................................................................
5) කොට්ඨාසය :- ..............................................................................

---

**පද්‍ය නිර්මාණය හා අවබෝධය**

**10 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

උපදෙස් :- I කොටසට අයත් සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

II හා III කොටස්වලින් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

**I කොටස**

01) පහත ජේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කවිය ජාතියට ප්‍රාණය පෙවූ අවියකි. නිදහසේ දැහැන, නිදහසේ මන්ත්‍රය, ලංකා මාතා වැනි නිර්මාණ තුළින් නිදාසිටි ජාතිය අවදි කරන්නට ටිබෙට් ජාතික මහින්ද හිමියන්ට හැකිවුයේ කවියෙනි. මව්වරු තම ළදරුවා නිදිකරවන්නට, සනසන්නට කවි කියති. ඒවා නැලවිලි කවි නම් වේ. පැල් කවි කියන්නේ පැල් රකින විට ය. පැල් රැකීම ලෙහෙසි පහසු කටයුත්තක් නොවන අතර අනේක දුක් දොම්නස්වලින් ගහණ කටයුත්තකි.

විවිධ වෘත්තීන් හා බැඳුණු කවිය පොළව සමඟ ජීවිත සටන ගෙනයන පතලය තුළින් ද ඇසිණි. ගල් පදවමින් වෙළෙඳාම් යන්නෝද කවි කීහ. හේනේ කුරක්කන් ඉසින විට, කෙතේ ගොයම් නෙලන විටත්, පාරුව පදින විටත් මුවගට ගලා ආවේ කවියකි. අතීත ජනයාගේ විවිධ වෘත්තීන් හා බැඳුණ තොරතුරු ජනයා අතරින්ම උපන් නිශ්චිත කතුවරයෙක් නැති මේ කවිතුළින් සොයාගත හැකිය.

කවි ලියන්නට හෝ කියන්නට හැකියාවක් පැවතිය යුතුය. එක් අයුරකින් ප්‍රතිභාව නමින් එය හැඳින්විය හැකිය. අපූර්වවස්තු නිර්මාණය කිරීමේ හැකියාව ප්‍රතිභාවයි. පෙරදිග විචාරකයෝ කවියක් බිහිවීමට හේතු තුනක් බලපාන බව පෙන්වා දේ. එනම් ප්‍රතිභාව, ව්‍යුත්පත්තිය හා සතතාභ්‍යාසයයි.

I. ඉහත ජේදයේ සඳහන් ටිබෙට් ජාතික මහින්ද හිමියන් ලියූ පද්‍ය නිර්මාණ දෙකක් නම් කරන්න.

-----------------------------------------------------------------------------------------

II. අතීතයේ විවිධ වෘත්තීන් හා බැඳුණු කවි වර්ග හතරක් නම් කරන්න.

-----------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------

III. විචාරකයන්ට අනුව කවියක් බිහිවන්නට බලපාන හේතු මොනවාද?

-----------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------

IV. නිශ්චිත කතුවරයෙක් නොමැති කාව්‍ය නිර්මාණ තුළින් අපට උගත හැකිවන්නේ මොනවාද?

-----------------------------------------------------------------------------------------

V. කවි ලිවීමේ හැකියාව මෙම ජේදයට අනුව හඳුන්වන්නේ කෙසේද?

-----------------------------------------------------------------------------------------

(ලකුණු 2X 5 =10)

02) පහත පද්‍ය නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් ලියන්න.

ඔය ඇල දොඩමලු ය සුවඳ බැරුවා ඉන්ට
නිල් වතුර තුරුලු කර කෙසේ අතහැර යම් ද?
කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩාගෙන
සොඳුර, නුඹ වාගේම හිනැහේය මා එක්ක

කුඹුක් අතු වතුර අතගගා නැමිලා දියට
දිය කෙළින හැටි පුංචි මාළුවෝ දුටුවාද?
පුර පසේ සඳ එක්ක තරගයට මෝරන්ට
හුලංඇා ඔය කිම්ද මල්වරව ඉල්මහට?

සෙනේහය පිරීගිය ඔබෙ නයන නිල් පොකුණ
දිය නිලන වැසිසමේ රැලි නගා උතුරා ය
තඹර පෙති අතර හෙල්මැලි රේණු වැසි වසින
ඔබෙ සිනාවෙන් නිවේ හුණුව ගිය ලේ නහර

රමණීය වන ගැබෙහි මොනරුන්ට පිල් වියන
සන්නාලියන් කොහොම ඇන්දා ද දේදුන්න
වැහි වතුර ඉහිනවා නම් ඔවුන් විහිළුවට
කුරුල්ලෝ ඉගිල්ලී වරෙන් නුඹ මා ළඟට

(ලකුණු 20)

03) පහත චිත්‍රය දෙස බලා පද්‍ය පහක කාව්‍ය නිර්මාණයක් කරන්න.



(ලකුණු 10)

04) පහත කාව්‍ය රීති අනුගමනය කරමින් හිස් පද පුරවන්න.

1. ලුම්බිණියේ සල් උයනේ සුවඳැති සල්මල් පිපුණේ
   දම්, සිල්, රැක මනු ගුණදම් රකින මගකි විවර වුණේ
   -----------------------------------------------------------
   -----------------------------------------------------------

2. පන්සිල් රැක පන්සල් යන නෙක දනන්ගෙ සිත් අතරේ
   නන්සිරිගත් මනුගුණදම් මග කෙටිකළ භව කතරේ
   -----------------------------------------------------------
   -----------------------------------------------------------

3. තණ්හාවෙන් මුලාවෙලා ආශාවන් කර ගහ ගෙන
   යන්නේ ඇයි මේ සසරේ දුන්කරදර පොදි බැඳ ගෙන
   -----------------------------------------------------------
   -----------------------------------------------------------

4. බවුන් වඩා නිවන් යන්න සවන් යොමා දම් රසයට
දුවන්නෙපා මුලාවෙලා සුවයයි බුදුගුණ මනසට
------------------------------------------------------------
------------------------------------------------------------

5. අපා දෙපා හා සිවුපා සියලු සතුන් මිතුරු වෙලා
එපා එපා මස්කන්නට මිසිදිටු මග මුලා වෙලා
------------------------------------------------------------
------------------------------------------------------------

(ලකුණු 2X 5 =10)

## II කොටස

මෙම II වන කොටසින් හෝ III වන කොටසින් එක් මාතෘකාවක් ඔස්සේ සඳැස් හෝ නිසඳැස් පද්‍ය නිර්මාණයක් කරන්න. අවම පද්‍ය 10 ක් වත් පැවතිය යුතුය.

1. විහාර මළුවට සඳරැස් වැටිලා මුළු වෙහෙරම එළියයි.

   මාතෘකාව :- පෝදා පන්සල

2. මතින් මිදුණු අපේ ලෝකයේ
   සතුටු වෙන්න එන්න යාළුවේ.....

   මාතෘකාව :- මත් වතුරෙන් අපි බේරෙමු.

(ලකුණු 50)

## III කොටස

1. බෝනික්කගෙ දතක් කැඩිල
   හිනාවෙන්න බෑ
   වෙල් දෙනිවල දුව පනින්න
   අපට ඉඩක් නෑ.......

   අපේ ළමා ලොව අහිමිවුණේ ඇයි? (පද්‍ය 10ක්)

(ලකුණු 50)